ගෙවත්තක දොඩම් පැළයක්, නාරං පැළයක් හෝ දෙහි පැළයක් සිටුවා ගන්න අපි කවුරුත් කැමතියි. පැඟිරි වර්ගයේ පැළයකින් ගෙවත්තට අලුත්ම නැවුම් බවක් ලබා දෙනවා. දෙහි හෝ දොඩම් පැළයක් සිටුවීමේදී අපි කවුරුත් බලාපොරොත්තු වන්නේ ගෙඩි පිරුණු ගසක්. නමුත් බොහෝ දෙනෙක් පැළ සිටුවා ගෙඩි නොමැතිව බොහෝ කාලයක් බලා ගෙන සිටිනවා. ඉතින් අපි බලමු. නිසි ස්ථානයක් තෝරා ගෙන විද්‍යාත්මකව පැළයක් සිටුවලා ගෙඩි ඇති ගසක් හදාගන්නේ කොහොමද කියලා.

මේ තොරතුරු ගෙවතු වලට පමණක් නොවෙයි. වාණිජ වශයෙන් මහා පරිමාණයෙන් දෙහි දොඩම් වගා කරන අයටත් එකසේම ප්‍රයෝජනවත් වේවි. මෙහිදී විස්තර කරන සියලුම කාරණා සලකා බලා ඒවා අනුගමනය කළොත් ඔබට අනිවාර්යයෙන්ම ගෙඩි පිරුණ ගසක් ලැබේවි. ඒ සමඟම එයින් විශාල සතුටක් ප්‍රීතියක් ලැබේවි.

## සිටුවීමට සුදුසු පැළයක් තෝරා ගන්න

විශ්වාසවන්ත තවානකින් හෝ අලෙවිහලකින් බද්ධ පැළයක් තෝරා ගන්න. මේ නිසා ඔබට ඉක්මනින් පල දරන ගසක් ලැබේවි.

## සිටුවීමට සුදුසු ස්ථානයක් තෝරා ගන්න

ගෙවත්තේ දෙහි හෝ දොඩම් පැලයක් සිටුවන විට ජලය බැස යන ස්ථානයක් තෝරා ගන්න. හොඳින් හිරුඑළිය වැටෙන ස්ථානයක් තෝරා ගන්න. දෙහි සහ දොඩම්වල මල් පිපෙන්නට නම් ගස්වලට හොඳින් හිරුඑළිය වැටෙන්නට අවශ්‍යයි. ඒත් එක්කම විශේෂයෙන්ම මතක තබා ගත යුතු කාරණයක් තිබෙනවා. මෙය දෙහි දොඩම් සිටුවන සෑම කෙනෙකුම අනිවාර්යයෙන්ම මතක තබා ගත යුතු කාරණයක්.

වසර 03 ක් පමණ ඉක්මවූ වැඩුණු දෙහි දොඩම් ගස්වල මල් පිපෙන්නට නම් මාස 2ක් පමණ පැලය අවට පස්වලට වතුර නොදා හොඳට වේලෙන්නට ඉඩ හැරීම අවශ්‍යයි. එම අවධියේදී දොඩම් ගස්වල කොළ අධිකව මැලවී යනවා. නමුත් ගස මැරෙන්නේ නැහැ.

මෙහිදී අවධාරණයෙන් මතක තබා ගත යුත්තේ මෙසේ ගසට පීඩාවක් ලබා දිය යුත්තේ පැළය සිටුවා ගසට අවුරුදු 03ක් පමණ ගතවූ පසුවයි. නැත්නම් පැළ අවධියේදී එසේ කළහොත් ගස මියයන්නට පුලුවන්. ගසට අවුරුදු 03ක් පමණ ඉක්මවූ විට එහි මූල පද්ධතිය පසේ ගැඹුරට විහිදී යන නිසා මතුපිට පස් තට්ටුවේ වතුර නැතිවුවත් පසේ ගැඹුරින් පිහිටි මුල් මඟින් ගසේ ජීවිතය පවත්වා ගන්නට ප්‍රමාණවත් අයුරින් වතුර ලබා ගන්නවා.

මෙහිදී සිදුවන්නේ පස් මතුපිට සිට අඟල් 2ක් පමණ යටින් පිහිටි මූල කේෂ එහෙමත් නැත්නම් කිරිමුල් මිය යනවා. නමුත් මාස 2කින් පමණ හොඳින් ජලය සපයන විට නැවතත් ගස නව පණක් ලබමින් අධිකව කිරිමුල් ඇති වෙනවා. ඒත් එක්කම අධිකව දළු ලියලමින් එම දළු අග මල් පිපෙනවා.

එසේ නම් ගෙඩි හැදෙන්නට ගසට පාලනයකින් යුතුව වතුර යොදන්නට වෙනවා. දිගින් දිගටම වතුර රැඳෙන ස්ථානවල පැඟිරි පවුලේ මෙම බෝග සිටුවූ විට ගෙඩියක් දෙකක් පමණක් තිබෙන පිරිහුණු ගසක් දකින්නට තිබේවි. නැත්නම් කොළ විතරක් තිබෙන ගසක් දකින්නට ලැබේවි.

ඉතින් කුස්සියේ වතුර පිටකරන ස්ථානයේ ළිඳේ වතුර ගලායන ස්ථානයේ මෙම පැල සිටුවන්න එපා. එවිට මල් පිපීම උත්තේජනය කරන්නට ගසට වතුර ලබා-නොදී පීඩාවක් ඇති කරන්න ක්‍රමයක් නැහැ.

## නිවැරදිව පැළය සිටුවන්න

අඩි 2 දිග අඩි 2 පළල අඩි 2 උස වලක් සකසන්න. සිටුවන ස්ථානයේ නිසරු තද පසක් සහිත නම් අඩි 3ක් දිග අඩි 3ක් පළල අඩි 3 උස වලක් සකසන්න. මෙයට කාබනික පොහොර කූඩ 02ක් පමණ එක්කර (හිස් යූරියා පොහොර බෑගයකින් 01ක් පමණ) පස් සමඟ කලවම් කර සති 02ක් පමණ ගොඩකර තබන්න.

ඉන් පසුව ඔබ සිටින්නේ වියළි කලාපයේ හෝ අතරමැදි කලාපයේ නම්, සැකසූ වලට

යූරියා ග්‍රෑම් 80 ක්
ටී.එස්.පී. ග්‍රෑම් 100 ක්
එම්.ඕ.පී. ග්‍රෑම් 45 ක් එක්කර දින 02කින් පොලිතීනය ප්‍රවේශමෙන් ඉවත්කර වලේ මැද පැළය සිටුවන්න.

ඔබ සිටින්නේ තෙත් කලාපයේ නම්, වලට

යූරියා ග්‍රෑම් 75 ක්
ටී.එස්.පී. ග්‍රෑම් 120 ක්
එම්.ඕ.පී. ග්‍රෑම් 25 ක් එක්කරන්න

පැළය සිටුවන විට පැළය සහිත බඳුනේ පස් මට්ටම පොළොවේ පස් මට්ටමට සමාන වන සේ සිටුවන්න. පැළය කෙලින් වැඩෙන්නට ඉක්මනින් දිරා නොයන කෝටුවක් සිටුවා සිටුවා එයට ගැට ගසන්න.

## අවධානයෙන් නඩත්තු කරන්න

සමහරක්විට නැගෙන චෝදනාවක් වන්නේ බද්ධ පැළයක් සිටවුවත් වල් වර්ගයේ ගෙඩි සෑදෙන බවයි. බොහෝදුරට මෙයට හේතුවන්නේ පැළයේ බද්ධ සන්ධියට පහළින් සෑදෙන රිකිලි වැඩීම නිසයි.

මේවා බද්ධ කළ රිකිල්ලට වඩා වැඩි වේගයෙන් වැඩෙනවා. මේ නිසා විටින් විට පරීක්ෂා කර බද්ධ කළ සන්ධියට පහළින් අලුතෙන් අතු රිකිලි වර්ධනය වේ නම් ඒවා ඉවත් කරන්න. වර්ෂා කාලයට පැළයේ පාමුල වතුර එක්රැස් වන්නට දෙන්න එපා.

වසර 03ක් ගතවන තෙක් පැළයට වතුර සහ පොහොර අවශ්‍යතාවයේ හිඟයක් ඇතිවන්නට දෙන්න එපා. හානිකරන රෝග සහ පළිබෝධකයින් ගැන අවධානයෙන් සිටින්න.


*විමසීම් :*
*නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ),*
*ප්‍රාදේශීය කෘෂිකර්ම මධ්‍යස්ථානය,*
*බණ්ඩාරවෙල*

*නියෝජ්‍ය අධ්‍යක්ෂ ,*
*උද්‍යාන බෝග පුහුණු සහ සංවර්ධන ආයතනය,*
*බිබිල*



*Designed by:* **AUDIO VISUAL CENTRE,** Department of Agriculture, Peradeniya.,
Printed by: **AGRICULTURE PRESS,** Gannoruwa.








# නිවැරදිව දොඩම් පැළයක් සිටුවමු




කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි
2011